# දේශප්‍රේමී එක්සත් ජාතික පක්‍ෂයේ ව්‍යවස්ථාව

## පක්‍ෂයේ නම

පක්‍ෂයේ නාමය දේශප්‍රේමී එක්සත් ජාතික පක්‍ෂය නම් වන්නේය.

## ලාංඡනය

පක්‍ෂයේ ලාංඡනය හදවත වන්නේය.

## ලිපිනය

පක්‍ෂයේ වර්තමාන ලිපිනය අංක : 181/V4, ගෝතමී උද්‍යානය, ගෝතමී පාර, රාජගිරිය වන්නේය.

## පක්‍ෂයේ දැක්ම

ශ්‍රී ලංකාව නැමති රාජ්‍යයෙහි ඉපදුන සිංහල දෙමළ මුස්ලිම් හා අනෙකුත් සියලු ජනයාගේ මාතෘභූමිය ශ්‍රී ලංකාවයි. වසර ගණනාවක අතීතයක සිට පෝෂණය වූ සිංහල බෞද්ධ මහා සංස්කෘතිය හා බැදුණු මේ සියලු ජාතීන් එකම රටක් එක ධජයක් යටතේ ගොඩනගනු ලබන ජාතිකවාදී ස්වජාතික රාජ්‍ය ගොඩනැගීම පක්‍ෂයේ දැක්ම වේ.

## පක්‍ෂයේ ප්‍රතිපත්ති

01. ශ්‍රී ලංකාව කිසිදු දිනයක බෙදා වෙන්කළ නොහැකි ඒකීය නිදහස් ස්වෛරී රාජ්‍යයකි. එහි වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනයා එහි උරුමක්කාරයෝය. ජනවර්ගය හෝ ආගමික ඇදහිලි මත බෙදා වෙන්වීම ප්‍රතික්ෂේප කරයි. ශ්‍රී ලංකාවේ ඉපදුන ඕනෑම පුරවැසියෙකුට ඕනෑම ප්‍රදේශයක ජීවත්වීමට, ජීවන වෘත්තියක, ව්‍යාපාරයක නිරතවීමට තම ආගමික හා සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂාකර ගැනීමට ඇති අයිතිය උත්තරීතර අයිතිවාසිකම් බව පිළිගත යුතුය.

02. අනාදිමත් අතීතයක සිට අප උරුම කියනු ලබන අපගේ දේපල වත්කම් හෝ භූමිය නොරටුන්ට විකිනීම හෙවත් විජාතික කරණයට විරුද්ධ විය යුතුය.

03. ජනතාව පෙලනු ලබන අන්තගාමී සංවෘත ආර්ථික ක්‍රමයත්, වසර ගණනාවක සිට අසමත්වූ නව ලිබරල්වාදී ආර්ථික දර්ශනයන් ප්‍රතික්ෂේප

කරයි. ඒ වෙනුවට අපට අනන්‍ය වූ නව ආර්ථික දර්ශනයක් කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

04. ශ්‍රී ලංකාව නැමති අප මාතෘභූමියෙහි උපත ලැබූ සියලු දෙනා උපන් බිමට අසීමිත ලෙස ආදරය කරන්නන් විය යුතුය. වසර දහස් ගණනක අතීතයේ සිට තම දිවිදීපුදා රැකගත් අප මාතෘභූමියත් එහි ඇති අමිල සම්පත් ද මේ පොළොව මතුපිට දිවෙන ඇල දොළ ගංගා කඳු ශිඛරයන්ට පමණක් නොව ගහකොළ සතා සීපාවන්ට ද තම දෙමාපියන්ට හා දරුවන්ට සේම ආදරය කරනු ලබන දේශප්‍රේමීන් විය යුතුය.

## පක්ෂයේ ව්‍යුහය

(1) ජාතික සම්මේලනය
(2) ජාතික විධායක සභාව
(3) විධායක සභාව
(4) ආසන බලමණ්ඩලය
(5) ශාඛා සංවිධානය
(6) අනුබද්ධ සංවිධාන

## ජාතික සම්මේලනය

(1) සියලුම වලංගු සාමාජිකත්වය හිමි සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් සෑම වසර 5 කට වරක් ජාතික සම්මේලනය රැස්විය යුතුය.

(2) අවශ්‍යතාවය මත විශේෂ ජාතික සම්මේලන කැඳවීමේ බලය විධායක සභාවේ එකඟතාවය මත පක්ෂයේ නායක ප්‍රධාන ලේකම්වරයා සතුය.

(3) මැතිවරණයකදී ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික සම්මේලනයක් කැඳවා ඉදිරිපත් කොට අනුමත කරවා ගත යුතුය.

## ජාතික විධායක සභාව

(1) පක්ෂයේ සභාපති, ලේකම් ප්‍රමුඛ විධායක සභාවේ නියෝජිතයන්, ආසන සංවිධායකයන්, ආසන බලමණ්ඩල ලේකම්වරුන්, අනුබද්ධ සංවිධාන

නියෝජනය කරමින් නියෝජිතයන් තිදෙනා බැගින්ද පක්ෂ නායකයා විසින් පක්ෂ සාමාජිකයන් අතරින් පත්කරනු ලබන නියෝජිතයන් 25 දෙනෙකුගෙන් සමන්විතය.

(2) ජාතික විධායක සභාව සෑම වසර 3කටම වතාවක් රැස්විය යුතුය.

(3) අවශ්‍යතාවය මත ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන දින 14 ක පූර්ව දින දැනුම්දීමකින් ජාතික විධායක සභාව කැඳවිය හැක.

(4) සාමාන්‍යයෙන් විශේෂ ජාතික සම්මේලනයට පෙර ජාතික විධායක සභාව රැස්වීම අනිවාර්ය අතර ජාතික සම්මේලනය සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා එලෙස ජාතික සම්මේලනයට ඉදිරිපත් කිරීමට පෙර ජාතික විධායක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

## විධායක සභාව

(1) විධායක සභාව පක්ෂයේ සභාපති, උප සභාපතිවරුන් තිදෙනෙකු, ප්‍රධාන ලේකම් හෙවත් පක්ෂ නායකයා, උප ලේකම් තිදෙනෙකු භාණ්ඩාගරික, උප භාණ්ඩාගාරික වරයා සහ පක්ෂ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා විධායක සභිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත වන්නේය.

(2) පක්ෂයේ මෙහෙයුම් යාන්ත්‍රණය විධායක සභාව වන්නේය.

(3) පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා පක්ෂයේ නායකයාද වන අතර විධායක සභාවේද ප්‍රධානියා වන්නේ පක්ෂයේ ලේකම්වරයාය.

(4) පක්‍ෂයේ සභාපතිවරයා විධායක සභාවේ මූලසුන හොබවනු ලබන අතර සභාපතිවරයා නොමැති විට උප සභාපතිවරයෙකු විසින් එම කාර්ය සිදුකරනු ඇත.

(5) පක්ෂයේ මෙහෙයුම් යාන්ත්‍රණය වන විධායක සභාවේ සාමාජිකයන් විසින් මෙහෙයවනු ලබන පහත සඳහන් අනු කාරක සභා පිහිටුවනු ඇත.

ඒ අනුව

(1) මූල්‍ය කටයුතු පිළිබඳ අනු කාරක සභාව

(2) ප්‍රචාරක හා ප්‍රවර්ධන අනු කාරක සභාව

(3) ජාත්‍යන්තර සබඳතා අනු කාරක සභාව

(4) ප්‍රතිපත්ති හා සැලසුම් අනු කාරක සභාව

(5) අධ්‍යාපනික ආගමික සාහිත්‍ය හා පර්යේෂණ අනු කාරක සභාව

## මූල්‍ය කටයුතු අනු කාරක සභාව

(1) පක්ෂයේ භාණ්ඩාගාරිකවරයා කැඳවුම්කරු වන අතර පක්ෂයේ මූල්‍ය කටයුතු, අරමුදල් රැස්කිරීම පවත්වාගෙන යෑම පරිහරණය හා ආයෝජනය යන කාර්යයන් මූල්‍ය කටයුතු පිළිබඳ කාරක සභාවට පැවරෙන්නේය.

(2) විධායක සභාව නියෝජනය කරනු ලබන සාමාජිකයන් 21 ක් දෙනා අතරින් තෝරාගත යුතු උපරිමය 15 ක් වන සාමාජික සංඛ්‍යාවකින් විය යුතුය. ඒ සඳහා පක්ෂයේ නායකයා වන ලේකම්වරයා අනිවාර්යෙන්ම පත්කළ යුතුය.

## ප්‍රචාරක හා ප්‍රවර්ධන අනු කාරක සභාව

(1) එහි බලධරයා පක්ෂයේ නායකයාද වන ප්‍රධාන ලේකම්වරයා වන අතර විධායක සභිකයන් අතරින් තෝරා ගන්නා සභිකයන් 15 ක උපරිමයකට යටත් වේ.

(2) පක්ෂයේ ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙල පිළිබඳව ජනතාව දැනුවත් කොට පක්ෂයේ සාමාජික ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

(3) මධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් අතරත් වෙනත් සමාජ ක්‍රියාකාරීන් සමඟත් සම්බන්ධතා ගොඩනැගීම.

(4) වෙනත් දේශපාලන පක්ෂ හා බහුජන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(5) විවිධ මධ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අනු කාරක සභාව

(1) මෙහි බලධරයා උප සභාපතිවරයා වන අතර මෙම කාරක සභාව සඳහාද සාමාජික සංඛ්‍යාවේ උපරිමය 15 ක් වන ලෙස විධායක සභිකයන් අතරින් තෝරා ගනු ලැබේ.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම.

(3) අප පක්ෂ ප්‍රතිපත්ති සමඟ එකඟ වන ජාත්‍යන්තර දේශපාලන පක්ෂ සංවිධාන සමඟ සම්බන්ධතා ගොඩනැගීම හා එකී සම්බන්ධතා පවත්වාගෙන යාම.

## ප්‍රතිපත්ති හා සැලසුම් අනු කාරක සභාව

(1) උප සභාපතිවරයෙකු මෙහි ප්‍රධානත්වය උසුලන අතර සාමාජික සංඛ්‍යාව උපරිමය 15 කට සීමා වේ.

(2) පක්ෂය වෙනුවෙන් නව ප්‍රතිපත්ති සම්පාදනය හා පක්ෂයේ උන්නතිය වෙනුවෙන් සැලසුම් සකස් කිරීම මෙම කාරක සභාවේ වගකීම වේ.

## අධ්‍යාපනික සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ අනු කාරක සභාව

(1) පක්ෂයේ උප සභාපතිවරයෙකු මෙම කාරක සභාවේද ප්‍රධානත්වය දරද්දී උපරිමය 15 ක් නොඉක්මවන සාමාජික සංඛ්‍යාවක් විධායක සභිකයන් අතරින් තෝරා පත්කර ගනු ඇත.

(2) මෙසේ සාමාජිකයන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම හා පක්ෂය මගින් සංවිධානය කරනු ලබන විවිධ අධ්‍යාපනික වැඩසටහන් පිළිබඳව වගකීම් දැරීම.

(3) ආගමික නායකයන් හා ආගමික සංස්ථාවන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම හා පවත්වාගෙන යාම.

(4) ආගමික සහජීවනය සඳහා ක්‍රියාකාරකම් පැවැත්වීම.

(5) ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු ජනයාගේ සංස්කෘතික සැබැදියාවන් තේරුම් ගෙන එම සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගනිමින් සංස්කෘතික සම්බන්ධතා ගොඩ නගමින් ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික දායාදයන් රැකගැනීමට කටයුතු කිරීම.

(6) ආගමික සහජීවනය ගොඩනැගීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

## ආසන බලමණ්ඩලය

(1) පාර්ලිමේන්තු මැතිවරණ බලප්‍රදේශයක් ආසන බලමණ්ඩලය ලෙස හැඳින්වේ.

(2) පක්ෂය විසින් නම් කරන ලද ආසන සංවිධායකයා බලමණ්ඩලයේ සභාපතිවරය වනු ඇත.

(3) ආසන බලමණ්ඩලයට අයත් ප්‍රදේශය තුල පිහිටුවා ඇති ශාඛා සමිතිවල සභාපති, ලේකම් ලෙස පවත්වන්නන් හා අනුබද්ධ සංවිධානවල ශාඛාවන්හි සභාපති, ලේකම්, භාණ්ඩාගාරික බලමණ්ඩල සාමාජිකයන් වනු ඇත.

(4) එම සාමාජිකයන් අතුරින් සභාපති හැර සෙසු නිලයන් තෝරාපත් කර ගනු ඇත.

(5) ඒ අනුව උප සභාපතිවරු දෙදෙනෙකු, ලේකම්වරයෙකු හා උපලේකම් වරයෙකු දෙදෙනෙකු භාණ්ඩාගාරික වරයෙකු උප භාණ්ඩාගාරික වරයෙක් තෝරා පත්කර ගත යුතුය.

මීට අමතරව 7 දෙනෙකුට නොඅඩු 15 දෙනෙකුට නොවැඩි කාරක සභිකයන් ප්‍රමාණයක් තෝරා පත්කර ගත යුතුය.

මෙසේ තෝරා පත්කර ගෙන ලබන නිලධරයන්ගේ නිළ කාලය වසරකි.

පක්ෂය මගින් ලබාදෙන උපදෙස් මත පක්ෂයේ උන්නතිය හා පාක්ෂිකයන්ගේ බලාපොරොත්තු ඉහල නැංවීම සඳහා තම බලප්‍රදේශය තුල ක්‍රියාත්මක වීම ක්‍රියාකාරී වීම ආසන බලමණ්ඩලය සතු වගකීම වේ.

අවම වශයෙන් මාස 3 කට වරක් හෝ ආසන බලමණ්ඩලය රැස්විය යුතුය. ලේකම්වරයගේ හා සභාපති වරයාගේ අත්සනින් එම කැඳවීම සිදුකල යුතුය.

## ශාඛා සංවිධාන

(1) ග්‍රාමසේවා වසමක් සඳහා එක් ශාඛාවක් හෝ කිහිපයක් පිහිටුවිය හැක.

(2) ශාඛාවන් පිහිටුවීම සඳහා අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව 25 කි.

(3) සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා උපසභාපති, උප ලේකම් උප භාණ්ඩාගාරික නිලධාරීන්ට අමතර සංවිධායක වරයෙකු 8 දෙනෙකුගෙන් යුතු කාරක සභාවක්ද තෝරා පත්කර ගත යුතුය.

(4) ශාඛා සංවිධානයට අනුබද්ධිතව තරුණ කාන්තා හා සෙසු සංවිධාන ගොඩනැගිය හැකිය.

## අනුබද්ධ සංවිධාන

(1) දේශප්‍රේමී ජාතික තරුණ සංගමය

(2) දේශප්‍රේමී ජාතික කාන්තා සංගමය

(3) දේශප්‍රේමී ජාතික වෘත්තිය සංගමය

(4) දේශප්‍රේමී ජාත්‍යන්තර සංගමය

## සාමාජිකත්වය

පක්ෂයේ අරමුණු හා පක්ෂයේ ව්‍යවස්ථාවන්ට එකඟවන්නා වූ ඕනෑම පුරවැසියෙකුට පක්ෂය මගින් නිකුත් කරන ලෙස සාමාජික අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර දීමෙන් පසුව පක්ෂ සාමාජිකත්වය අයදුම් කල හැක.

විධායක සභාවේ අනුමැතියට යටත්ව නියමිත වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවූ පසු පක්ෂ සාමාජිකත්ව පිරිනැමේ.

## ලේකම් / නායක

(1) පක්ෂයේ මහලේකම්වරයා නිරන්තරයෙන්ම නායකයාද වන්නේය.

(2) ඔහු න්‍යාය වශයෙන් හා දේශාපලන වශයෙන් ජාතික මගපෙන්වන්නෙකු ලෙස පක්ෂය මෙහෙය වන්නේය.

(3) ස්වකීය ඉල්ලා අස්වීම මත හෝ තනතුර දැරිය නොහැකි ලෙස මානසික, කායික ආබාධයකට ලක්වී ඇති විටකදී හැර කිසිදු ආකාරයකින් පක්ෂයේ මහලේකම්වරයා ඉවත් කල නොහැක.

(4) පක්ෂයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ අයිතිය පක්ෂ නායකත්වයට හිමිවන අතර එම සෑම තීරණයක් පිළිබඳ විධායක සභාව දැනුවත් කොට අනුමත කරවා ගත යුතුය.

(5) විධායක සභාව, ජාතික විධායක සභාව සහ පක්ෂ සංවිධානය කැඳවීමේ බලය ප්‍රධාන ලේකම්වරයා සතුය.

(6) පක්ෂ වාර්තා සකස් කිරීම, පවත්වාගෙන යාම, දේශීය හා විදේශීය දේශපාලන පක්ෂ හා සංවිධාන සමඟ සම්බන්ධතා පැවැත්වීම. මධ්‍ය නිවේදන හා පක්ෂය වෙනුවෙන් සිදු කරනු ලබන සියලු ලිපි ලේඛන සඳහා මහලේකම් වරයා අත්සන් තැබීම අනිවාර්ය වේ.

(7) මූල්‍ය කටයුතු පවත්වාගෙන යාමේදී භාණ්ඩාගාරික වරයාගේ හෝ බලය පවරන ලද වෙනත් නිලධාරි වරයෙකුගේ අත්සනට අමතරව මහලේකම් වරයාගේ අත්සන අනිවාර්ය වේ.

(8) මැතිවරණ සඳහා අපේක්ෂකයන් තේරීමේදී අනිවාර්යයෙන්ම මහලේකම් වරයාගේ අනුමැතිය අවසාන අනුමැතිය වේ.

(9) පක්ෂයේ විනය බලධාරියාද වන්නේ මහලේකම් වරයාය. කිසියම් සාමාජිකයෙකු පක්ෂයේ විනය කඩ කොට ඇති අවස්ථාවක ඔහුගේ හෝ ඇයගේ විනය විරෝධී ක්‍රියාව විභාග කිරීමටත්, අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමටත් 5 දෙනෙකුගෙන් යුත් විනය මන්ඩලයක් පිහිටුවනු ලැබේ. විනය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙර ඒ පිළිබඳව පක්ෂයේ විධායක සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

## <u>සභාපති</u>

(1) සභාපති ධූරය සඳහා පක්ෂයේ සාමාජිකයන් අතරින් අයෙකු පක්ෂ නායක වරයා විසින් පත් කරන අතර නායකත්වයේ අභිමතය පරිදි එය වෙනස් කල හැක.

(2) සභාපති ධූරයේ නිල කාලයේ වසරකි. එකී නිල කාලය අවසන් වූ පසු සුදුසු සාමාජිකයෙකු එකී නිළයට පත්කිරීම වසර අවසානයේ පැවැත්වෙන විධායක සභාවේදී සිදුකල හැකිය.

(3) පක්ෂ නායකයාගේ උපදෙස් මත පක්ෂ නායකයා නොමැති විටක නියෝජ්‍ය ලේකම්වරයා සමඟ එක්ව පක්ෂයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සභාපතිවරයා සතු වගකීමකි.

(4) විධායක සභාව මගින් තීරණය කරනු ලබන කාරක සභාවක කැඳවුම්කාරිත්වය උසුලමින් කටයුතු කිරීමද සභාපතිවරයාගේ වගකීමකි.

## භාණ්ඩාගාරික

(1) භාණ්ඩාගාරික තනතුර පක්ෂයේ මුදල් කටයුතු මෙහෙයවීම පිළිබඳ වගකියනු ලැබේ. පක්ෂයේ මූල්‍ය කටයුතු පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වයද දරනු ලබන්නේ භාණ්ඩාගාරික වරයාය.

(2) පක්ෂ නායක / ලේකම්ට අමතරව මුදල් ගණුදෙනු කිරීමේදී අත්සන් තැබීමේ බලය භාණ්ඩාගාරික වරයාට හිමිවේ.

(3) පක්ෂයේ මූල්‍ය වාර්තා නිසි පරිදි පවත්වාගෙන යමින් සෑම හය මසකට වරක් ඒ පිළිබඳ විධායක සභාව දැනුවත් කිරීම භාණ්ඩාගාරික වරයාගේ වගකීම වේ.

(4) භාණ්ඩාගාරික වරයාගේ සහායට උප භාන්ඩාගාරික වරයෙකු ද වේ.

## උප සභාපති වරු හා උප ලේකම්වරු

(1) උප සභාපතිවරු හා උප ලේකම්වරු තිදෙනෙකි.

(2) සභාපතිවරයා හා ප්‍රධාන ලේකම්වරයා වෙනුවෙන් රාජකාරී ආවරණය කිරීමේ බලය අවස්ථානුකූලව උප සභාපතිවරුන්ට හා උප ලේකම්වරුන්ට හිමිවේ.

(3) විධායක සභාව මගින් පිහිටුවන ලද කාරක සභා වල සභාපතිත්වය දරමින් තම වගකීම් ඉටුකිරීමට උප සභාපතිවරු හා උප ලේකම්වරු බැඳී සිටී.